| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/02/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.10.23 |

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**<u>2020 වර්ෂයේ Covid වසංගතය සඳහා ගෙවූ මුදල් භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කිරීම.</u>**

2020 වර්ෂයේ Covid වසංගතයෙන් අවතැන් වූ පවුල් වලට සමාජ ප්‍රතිලාභ ගෙවීමේදී ප්‍රජාමූල බැංකු හා ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් ගෙවූ මුදල් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, මෙම මුදල් 2020 වර්ෂයේ අප්‍රේල් සිට ජුනි දක්වා අදියර I සහ II වශයෙන් ගෙවීම් කර ඇත. මෙම මුදල් ගෙවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස ආයෝජනය කර ඇති මුදල් වලින් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ඇති අරමුදල් වලින් ගෙවීම් කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස ආයෝජනය කර ඇති මුදල් ද ඔබ බැංකු වල අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුම් හිමියන්ගේ මුදල් වන අතර, එම මුදල් ද අප විසින් ඔබ වෙත එවිය යුතුව ඇත. එසේම ඔබ බැංකුව විසින් ප්‍රධාන කාර්යාලයෙන් එවා ගෙවූ මුදල් වලට අමතරව බැංකුව විසින් බැංකුවේ අරමුදල් වලින් ගෙවූ මුදල් ද ඔබ බැංකුවට ගෙවිය යුතුව ඇත.

03. භාණ්ඩාගාරය විසින් Covid ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන් ඔබ බැංකුවෙන් හා ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාගත් මුදල් 2024 වර්ෂයේ ප්‍රතිපූර්ණය කරන බවට අප වෙත දන්වා තිබූ අතර, එම මුදල් 2024 නොවැම්බර් 10 ට පෙර ගෙවන බව මේ වනවිට අප වෙත දන්වා ඇත. ඒ සඳහා විශේෂ සාකච්ඡා දෙකක් ද මහා භාණ්ඩාගාරයේදී පැවැත්වූ අතර, එහිදී බැංකු මට්ටමින් මෙම රු.5000/- දීමනාව ප්‍රතිලාභීන්ට ගෙවූ බව සනාථ කරන කළමනාකරු විසින් සහතික කරන ලද ප්‍රතිලාභී නාම ලේඛනය ඉදිරිපත් කරන ලෙස අප වෙත දන්වන ලදි. එම ප්‍රතිලාභී ලේඛන සහතික කර ඉදිරිපත් කළ විගස එම මුදල් කඩිනමින් අප වෙත ලබාදෙන බවට මහා භාණ්ඩාගාරය විසින් පොරොන්දු වී ඇත.

04. ඒ අනුව, 2020 වර්ෂයේ I සහ II අදියර යටතේ බැංකු වලින් ගෙවන ලද මුදල් දිස්ත්‍රික් සාරාංශය ඇමුණුම 01 සහ 02 වශයෙන් මේ සමඟ ඔබවෙත එවා ඇත.

05. ඒ අනුව, බැංකු මට්ටමින් 2020 අප්‍රේල් සිට ජුනි දක්වා අදියර I සහ II යටතේ Covid රු.5000/- ගෙවූ පොදු 36 වවුචර වල සහතික කළ පිටපත් හෝ බැංකුව විසින් සකස් කර ගෙන ගෙවන ලද ලේඛනවල පිටපත් බැංකු කළමනාකරු විසින් සහතික කර, (Covid වසංගතය අවස්ථාවේදී ප්‍රතිලාභීන්ට රු.5000.00 ගෙවීම් කළ ලේඛනයේ සහතික කළ පිටපතකි.) බැංකු කළමනාකරුගේ අත්සනින් හා සමිති කළමණාකරුගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත යොමු කර දිස්ත්‍රික් අධ්‍යක්ෂගේ අත්සනින් එය සනාථ කර අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.10.31 දිනට පෙර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

06. මෙම ලේඛන එවීමේදී දිස්ත්‍රික්කයේ සියලු බැංකුවල ලේඛන බැංකු මට්ටමින් ගොනු ලෙස සකස් කර දිස්ත්‍රික් කාර්යාලයට එකතු කොට දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරියෙකු මඟින් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ගෙනැවිත් භාර දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

07. 2025 අයවැය ලේඛනයට මෙය ඇතුළත් නොකරන බැවින් මෙම අවස්ථාව මඟහැරී ගියහොත් මෙම මුදල් නැවත නොලැබෙන බවද භාණ්ඩාගාරය විසින් අප වෙත දන්වා ඇත.

08. ඇමුණුම 03 හි සඳහන් එම ලේඛනය සකස් කර ඇති පරිදි දිස්ත්‍රික් බැංකු විෂය කළමණාකරු හා දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් සහතික කර එවිය යුතු බවද සඳහන් කරමි.

මෙය ප්‍රමුඛ හා හදිසි කටයුත්තක් ලෙස සලකා ඉතා වගකීමෙන් මෙම කාර්යය ඉටුකරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

සී.ඩී.කළුආරච්චි,

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - | කා.දැ.ගැ.ස. |
| 03. ප්‍රධාන ගණකාධිකාරි | - | කා.දැ.ගැ.ස හා අ.ක.ස. |
| 04. ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | කා.දැ.ගැ.ස හා අ.ක.ස. |